සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA2 විභාගය - 2018 ජූලි

## (AA21) උසස් මූල්‍ය ගිණුම්කරණය

(Advanced Financial Accounting)

2018-07-21
පෙරවරු
[8.45 – 12.00]

පිටු ගණන : 12
ප්‍රශ්න ගණන: 10

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර **පමණක්** භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

අනිවාර්යය ප්‍රශ්න අට (08) කි.

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

*අංක **1.1** සිට **1.4** දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාළ අංකය ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.1 පහත සඳහන් තොරතුරු, **සිරිපාල ට්‍රේඩර්ස්** හි 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයට අදාළ වේ:

| | රු. |
|---|---|
| ආරම්භක තොගය | 40,000 |
| අවසාන තොගය | 30,000 |
| ගැනුම් | 350,000 |
| විකුණුම් | 600,000 |

2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සිරිපාල ට්‍රේඩර්ස් හි** දළ ලාභ ආන්තිකය (gross profit margin) වන්නේ:

(1) 60%. (2) 40%. (3) 37%. (4) 53%.

(ලකුණු 02)

1.2 සමාගම්වලට අදාල පහත සඳහන් ප්‍රකාශන සලකා බලන්න:

(a) සමාගමක වරණීය කොටස්හිමියන්ට සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීමේදී ඡන්දය ලබා දීමේ අයිතිය තිබේ.

(b) සමාගමට ලාභ තිබේ නම් පමණක් ණයකර හිමියන්හට පොලී ගෙවනු ලැබේ.

(c) සාමාන්‍ය කොටස්හිමියන්ට ස්ථාවර ලාභාංශ ගෙවීමට බැඳියාවක් නොමැත.

ඉහත සඳහන් ප්‍රකාශන අතුරෙන්, සමාගම් සම්බන්ධයෙන් අදාල නිවැරදි ප්‍රකාශනය / ප්‍රකාශන වන්නේ:

(1) **(a)** පමණි. (2) **(b)** පමණි. (3) **(c)** පමණි. (4) **(b)** සහ **(c)** පමණි.

(ලකුණු 02)

1.3 පහත සඳහන් ප්‍රකාශන අතුරෙන්, ලාභ අරමුණු කර නොගත් සංවිධාන [Non-Profit Organizations (NPOs)] සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශනය වන්නේ කුමක් ද?

(1) ලාභ අරමුණු කර නොගත් සංවිධාන ආදායම් උපයා ගන්නේ සාමාජික ගාස්තුවලින් පමණි.

(2) ලාභ අරමුණු කර නොගත් සංවිධානවලට ලැබෙන පරිත්‍යාග (donations) සමුච්චිත අරමුදලේ (Accumulated Fund) සටහන් කරනු ලැබේ.

(3) ලාභ අරමුණු කර නොගත් සංවිධානයක ප්‍රධාන අරමුණ වන්නේ එහි අතිරික්තය වැඩිකර ගැනීමයි.

(4) ඉහත සඳහන් කිසිවක් නොවේ. (ලකුණු 02)

1.4 2017 අප්‍රේල් 01 දිනට **සීමාසහිත B සමාගමේ** ශේෂ පිරික්සුමෙන් පහත සඳහන් තොරතුරු උපුටාගන්නා ලදි:

| | **හර (රු.'000)** | **බැර (රු.'000)** |
|---|---|---|
| මෝටර් වාහනය - පිරිවැයට (2014 අප්‍රේල් 01 දින මිලදීගත්) | 5,000 | |
| සමුච්චිත ක්ෂය - මෝටර් වාහනය | | 1,500 |

මෝටර් වාහනයේ ප්‍රයෝජනවත් ආයු කාලය වර්ෂ 10 ක් වෙතැයි ඇස්තමේන්තු කර ඇත. 2018 මාර්තු 31 දින සමාගම, මෙම මෝටර් වාහනය රු.3,200,000/- කට, විකුණන ලදී.

ඉහත සඳහන් තොරතුරුවලට අනුව, මෝටර් වාහනය ඉවත්කිරීමේ ලාභය හෝ අලාභය වන්නේ:

(1) රු.200,000/- ක ලාභයකි. (2) රු.200,000/- ක අලාභයකි.

(3) රු.300,000/- ක ලාභයකි. (4) රු.300,000/- ක අලාභයකි. (ලකුණු 02)

*අංක **1.5** සිට **1.8** දක්වා ප්‍රශ්නවලට උත්තර, ප්‍රශ්න අංකය සමග උත්තර පොතේ ලියන්න.*

1.5 **අමල්, බිමල්** සහ **චමල්** ලාභ'ලාභ පිළිවෙලින් 3:5:2 අනුපාතයට බෙදාගනිමින් හවුල් ව්‍යාපාරයක නියැලී සිටියහ. **බිමල්** හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාම ගැනීමට තීරණය කළ අතර, **අමල්** සහ **චමල්** ලාභ'ලාභ පිළිවෙලින් 3:2 අනුපාතයට බෙදා ගනිමින් හවුල් ව්‍යාපාරය දිගටම පවත්වාගෙන යාමට එකඟ වූහ.

නව හවුල් ව්‍යාපාරයේ **අමල්ගේ** සහ **චමල්ගේ** භුක්ති විඳීමේ අනුපාතය (Gaining Ratio) ගණනය කරන්න.

(ලකුණු 02)

1.6 සීමාසහිත පෞද්ගලික සමාගමක් සහ හවුල් ව්‍යාපාරයක් අතර ඇති වෙනස්කම් තුනක්(03) සඳහන් කරන්න.

(ලකුණු 03)

**1.7** සමාගමක් ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් කිරීම් (FIFO) ක්‍රමය භාවිතයෙන් එහි තොග අගය කරයි. ඒකකයක් රු.170/- බැගින් වූ පිරිවැයකට ඇගයීම් කරන ලද එක්තරා තොග අයිතමයකින් ඒකක 500 ක්, 2018 අප්‍රේල් 01 දිනට සමාගම සතුව තිබුණි.

2018 අප්‍රේල් මාසය තුළදී පහත සඳහන් ගනුදෙනු සිදුවිය:

| **දිනය** | **මිලදී ගැනුම්** | **විකුණුම්** |
|---|---|---|
| අප්‍රේල් 05 | - | ඒකක 300 |
| අප්‍රේල් 10 | එකක් රු.150/- බැගින් ඒකක 150 | - |
| අප්‍රේල් 27 | - | ඒකක 250 |

2018 අප්‍රේල් 30 දිනට තොගයේ අගය ගණනය කරන්න. (ලකුණු 03)

**1.8** **සීමාසහිත XYZ සමාගමේ** කළමනාකාරිත්වය විසින් 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ සමාගමේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා, 2018 ජූනි 15 දින අනුමත කර තිබුණි.

**සීමාසහිත XYZ සමාගමේ** වාර්තාකරණ කාලපරිච්ඡේදයෙන් පසුව නමුත් මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට අනුමැතිය දීමට පෙර සිදුවූ පහත සඳහන් එක් එක් සිදුවීම, වාර්තාකරණ කාලපරිච්ඡේදයෙන් පසු සිදුවීම්වලට අදාල වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - 10 (LKAS 10) අනුව, ගලපනු ලබන සිදුවීමක්ද, නැද්ද යන්න සඳහන් කරන්න:

(1) සමාගම, සාමාන්‍ය කොටස්හිමියන්ට ලාභාංශ ප්‍රකාශයට පත් කිරීම.

(2) පිරිවැයට වඩා අඩු මිලකට තොග විකිණීම.

(3) ගනුදෙනුකරුවෙකුගේ බුන්වත්භාවය (bankruptcy).

(4) ප්‍රධාන නිෂ්පාදන පිරියතක් ගින්නෙන් විනාශවීම. (ලකුණු 04)

*A කොටසෙහි අවසානය*

## B කොටස

අනිවාර්යය ප්‍රශ්න පහ (05) කි.

(මුළු ලකුණු 25)

## 02 වන ප්‍රශ්නය

**රිකෝත් ට්‍රේඩර්ස්හි** පොත්වලින් පහත සඳහන් තොරතුරු උපුටාගන්නා ලදී:

(1) 2018 අප්‍රේල් 30 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශනය:

| | **(රු.)** | **(රු.)** |
|---|---|---|
| 2018 අප්‍රේල් 30 දිනට, මුදල් පාලන ගිණුමේ (මුදල් පොතේ) ශේෂය | | 15,200 |
| **එකතු කළා:** නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත්: | | |
| 265975 | 12,300 | |
| 265985 | 15,350 | 27,650 |
| **අඩු කළා:** උපලබ්ධි නොවූ තැන්පතු: | | |
| චෙක්පත් තැන්පතුව 257461 | | (65,000) |
| **2018 අප්‍රේල් 30 දිනට බැංකු ප්‍රකාශනයට අනුව ශේෂය** | | **(22,150)** |

(2) 2018 මැයි 31 දින රු.3,500/- ක චෙක්පොත් ගාස්තු බැංකුව විසින් අඩුකරගෙන ඇති අතර, මෙය මුදල් පොතේ සටහන් කර නොමැත.

(3) පහත සඳහන් නිකුත් කරන ලද චෙක්පත් 2018 මැයි 31 දින වනවිට බැංකුව වෙත ඉදිරිපත් කර නොතිබුණි:

| **චෙක්පත් අංකය** | **නිකුත් කළ දිනය** | **වටිනාකම (රු.)** |
|---|---|---|
| 265975 | 2018.04.15 | 12,300 |
| 266105 | 2018.05.15 | 3,200 |
| 266115 | 2018.05.31 | 60,000 |

(4) 2018 අප්‍රේල් 30 දිනට පැවති සියලුම උපලබ්ධි නොවූ තැන්පතු 2018 මැයි මාසය තුළදී උපලබ්ධි වී තිබුණි.

(5) 2018 මැයි 29 දින, බැංකුව විසින් වැරදිමකින් රු.13,200/- ක් **රිකෝන් ට්‍රේඩර්ස්** හි බැංකු ගිණුමට හර කර තිබුණි.

(6) සමාගම විසින් 2018 මැයි 27 දින බැංකු ගිණුමේ තැන්පත් කළ පහත සඳහන් චෙක්පත 2018 මැයි 31 දින වන විටත් උපලබ්ධි වී නොතිබුණි:

| **චෙක්පත් අංකය** | **වටිනාකම (රු.)** |
|---|---|
| 452122 | 25,000 |

(7) 2018 මැයි 31 දිනට මුදල් පාලන ගිණුමේ (මුදල් පොතේ) හර ශේෂය (වාසිදායක ශේෂය) රු.49,000/- ක් විය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) 2018 මැයි 31 දිනට ගලපන ලද මුදල් පාලන ගිණුම (මුදල් පොත). (ලකුණු 02)

(b) 2018 මැයි 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශනය. (ලකුණු 03)

(මුළු ලකුණු 05)

## 03 වන ප්‍රශ්නය

**සෙවන හාඩ්වෙයාර්** හි පොත්වලින් 2018 මැයි මාසය සඳහා පහත සඳහන් තොරතුරු උපුටා ගන්නා ලදී:

| | **රු.** |
|---|---|
| ණයට විකුණුම් | 750,000 |
| ණයට ගැනුම් | 350,000 |
| ණයහිමියන්ට ගෙවීම් | 450,000 |
| ණයහිමියන්ගෙන් ලද වට්ටම් | 4,300 |
| ණයගැතියන්ගෙන් ලැබීම් | 725,200 |
| ණයගැතියන්ට දුන් වට්ටම් | 14,800 |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2018 මැයි 01 දිනට පාලන ගිණුම්හි ශේෂයන් පහත පරිදි වේ:

| | **රු.** |
|---|---|
| ණයගැති පාලන ගිණුම | 1,565,000 (හර) |
| ණයහිමි පාලන ගිණුම | 860,000 (බැර) |

(2) ණයහිමියෙකු වෙත ගෙවන ලද රු.12,600/- ක වටිනාකමක් සහිත චෙක්පතක් ගිණුමේ ප්‍රමාණවත් ශේෂයක් නොතිබීම නිසා, බැංකුව විසින් 2018 මැයි 31 දින අගරු කර තිබුණි. **සෙවන හාඩ්වෙයාර්** විසින් එය පියවීමට 2018 ජූනි මාසයේ නව චෙක්පතක් ලබාදීමට එකඟ වී ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2018 මැයි මාසය සඳහා පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) ණයගැති පාලන ගිණුම. (ලකුණු 02)

(b) ණයහිමි පාලන ගිණුම. (ලකුණු 03)

(මුළු ලකුණු 05)

## 04 වන ප්‍රශ්නය

**සීමාසහිත සවුත්පෝල් (පෞද්ගලික) සමාගමේ** ගිණුම් පොත්වලින්, 2018 මාර්තු මාසය සඳහා පහත සඳහන් ශේෂ උපුටාගන්නා ලදී:

| | රු. |
|---|---|
| උපයන විට ගෙවීම් (PAYE), ණය වාරික සහ සේවක අර්ථ සාධක අරමුදල (EPF) (8%) අඩුකර ගැනීමට පෙර මූලික වැටුප | 7,320,000 |
| උපයන විට ගෙවීම් (PAYE) අඩුකිරීම් | 180,000 |
| ණය වාරික අඩුකිරීම් | 50,000 |

සේවක අර්ථසාධක අරමුදල (EPF) සඳහා සේවකයන්ගේ මූලික වැටුපෙන් 8% ක් අඩුකරනු ලැබේ. මූලික වැටුපෙන් සේවක අර්ථසාධක අරමුදල (EPF) සඳහා 12% ක් සහ සේවක භාරකාර අරමුදල (ETF) සඳහා 3% ක් බැගින් සමාගම විසින් දායක වේ. සේවකයන්ගේ වැටුප් 2018 මාර්තු 31 දිනද, සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාර අරමුදල සඳහා දායක 2018 අප්‍රේල් 10 දිනද සිදුකරනු ලැබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2018 මාර්තු මාසය සඳහා පහත සඳහන් ලෙජර් ගිණුම් **පිළියෙල කරන්න**:

(a) වැටුප් පාලන ගිණුම. (ලකුණු 03)

(b) ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල් (EPF) ගිණුම. (ලකුණු 02)

(මුළු ලකුණු 05)

## 05 වන ප්‍රශ්නය

**අමල්, කමල්** සහ **නිමල්** පිළිවෙලින් 2:2:1 අනුපාතයට ලාභා'ලාභ බෙදාගනිමින් හවුල් ව්‍යාපාරයක යෙදී සිටී.

හවුල් ව්‍යාපාර ගිවිසුමේ පහත සඳහන් කොන්දේසි ඇතුලත් වේ:

(1) හවුල්කරුවන්ගේ ආරම්භක ප්‍රාග්ධන ගිණුම් ශේෂ මත වර්ෂයකට 10% බැගින් ප්‍රාග්ධනය මත පොලී ගෙවනු ලැබේ.

(2) පහත සඳහන් වැටුප් ලැබීමට හවුල්කරුවන් හිමිකම් ලබයි:

**කමල්** - මාසිකව රු.60,000/- බැගින්

**නිමල්** - මාසිකව රු.25,000/- බැගින්

(3) පහත සඳහන් ශේෂ, 2018 මාර්තු 31 දිනට හවුල් ව්‍යාපාරයේ ශේෂ පිරික්සුමෙන් උපුටාගෙන ඇත:

*(රු.'000)*

| | හර | බැර |
|---|---|---|
| ප්‍රාග්ධන ගිණුම් - 2017 අප්‍රේල් 01 දිනට: | | |
| **අමල්** | | 2,000 |
| **කමල්** | | 2,000 |
| **නිමල්** | | 1,000 |
| වර්ෂය තුළ ගැනිලි: | | |
| **අමල්** | 800 | |
| **කමල්** | 600 | |

(4) 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ විසර්ජනය කිරීමට පෙර ශුද්ධ ලාභය රු.2,329,000/- කි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ලාභා'ලාභ විසර්ජන ගිණුම **පිළියෙල කරන්න**.

(ලකුණු 05)

## **06** වන ප්‍රශ්නය

ලාභා'ලාභ පිළිවෙලින් 2 : 1 අනුපාතයට බෙදා ගනිමින් **බ්‍රයිට් ලයිට්ස්** නම යටතේ **සත්** සහ **මූන්** හවුල් ව්‍යාපාරයක නිරතව සිටියහ.

2018 අප්‍රේල් 01 දක්වා හවුල් ව්‍යාපාරයේ එදිනෙදා ක්‍රියාකාරකම් **සත්** විසින් කළමනාකරණය කරන ලදි. එදින සිට **සත්** හවුල් ව්‍යාපාරයේ එදිනෙදා ක්‍රියාකාරකම් කළමනාකරණය කිරීමෙන් විශ්‍රාම ගැනීමට තීරණය කළ අතර, 2018 අප්‍රේල් 01 දින සිට ලාභා'ලාභ බෙදාගැනීමේ අනුපාතය වෙනස්කොට එම කාර්යභාරය බාර ගැනීමට **මූන්** එකඟ විය.

**සත්** සහ **මූන්** අතර ඉහත කී වෙනස්කිරීම් සිදුකිරීම සඳහා පහත සඳහන් දෑ සම්බන්ධයෙන් ඔවුහු එකඟ වූහ:

(1) 2018 අප්‍රේල් 01 දිනට හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු.3,000,000/- කට අගය කළ අතර, කීර්තිනාම ගිණුමක් පවත්වා නොගෙන හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් හරහා ඒ සඳහා ගැලපීම් කිරීම.

(2) **සත්** සහ **මූන්** අතර ලාභා'ලාභ බෙදාගැනීමේ අනුපාතය පිළිවෙලින් 1 : 2 ලෙස වෙනස් කිරීම.

(3) රු.2,000,000/- කට අගය කරන ලද **මූන්ගේ** පෞද්ගලික වෑන් රථය හවුල් ව්‍යාපාරයට අතිරේක ප්‍රාග්ධනය ලෙස 2018 අප්‍රේල් 01 දින ඔහු විසින් මාරු කරන ලදි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2018 අප්‍රේල් 01 දිනට සිදුවූ ඉහත ගනුදෙනු වාර්තා කිරීම සඳහා ජර්නල් සටහන් **පිළියෙල කරන්න**. (ලකුණු 05)

*B කොටසෙහි අවසානය*

## C කොටස

අනිවාර්යය ප්‍රශ්න තුන (03) කි.

(මුළු ලකුණු 30)

### 07 වන ප්‍රශ්නය

**රෝස් සමාජය** නාට්‍ය කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා ආරම්භ කරන ලද සාමාජිකයන්ගේ සමාජයක් වන අතර, සාමාජිකයන්ගේ ප්‍රයෝජනය සඳහා අවන්හලක්ද එමගින් පවත්වාගෙන යනු ලැබේ.

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **රෝස් සමාජයේ** ගනුදෙනු, පහත සඳහන් ලැබීම් සහ ගෙවීම් ගිණුමේ, පෙන්නුම් කෙරේ: *(රු.'000)*

| ලැබීම් සහ ගෙවීම් ගිණුම | | | |
|---|---|---|---|
| 2017 ජනවාරි 01 දින ඉ/ගෙ ශේෂය | 3,500 | අවන්හලේ සැපයීම් සඳහා සිදුකළ ගැනුම් | 18,000 |
| පරිත්‍යාග | 6,000 | අවන්හලේ වෙනත් වියදම් | 3,400 |
| නාට්‍ය ටිකට් විකුණුම් | 25,000 | නාට්‍ය සඳහා ආරාධිත ශිල්පීන්ගේ ගාස්තු | 5,000 |
| සාමාජික දායක මුදල් | 4,000 | නාට්‍ය සඳහා ප්‍රචාරණය | 1,500 |
| අවන්හලේ විකුණුම් | 30,000 | නාට්‍ය ශාලා උපකරණ (2017 දෙසැම්බර් 31 දින මිලදී ගන්නා ලද) | 10,000 |
| | | නාට්‍ය නිෂ්පාදන වියදම් | 15,000 |
| | | විදුලිය | 1,500 |
| | | 2017 දෙසැම්බර් 31 දින ප/ගෙ ශේෂය | 14,100 |
| | **68,500** | | **68,500** |

වත්කම් සහ වගකීම් පහත සඳහන් පරිදි විය:

*(රු.'000)*

| | 2017 ජනවාරි 01 දිනට | 2017 දෙසැම්බර් 31දිනට |
|---|---|---|
| ඉඩම සහ ගොඩනැගිලි ධාරණ අගයට | 70,000 | 68,000 |
| නාට්‍ය ශාලා උපකරණ ධාරණ අගයට | 12,000 | 17,000 |
| හිඟ සාමාජික දායක මුදල් | 700 | 500 |
| ඉදිරියට ලැබුණ සාමාජික දායක මුදල් | 300 | 200 |
| අවන්හලේ තොගය - පිරිවැයට | 7,000 | 5,000 |

- පරිත්‍යාග, වර්ෂය සඳහා ලද ආදායමක් ලෙස හඳුනාගතයුතු අතර, විදුලි වියදම්වලින් 1/3 ක් අවන්හල සඳහා අයකළ යුතුවේ.
- මිලදීගත් නාට්‍ය ශාලා උපකරණ හැර, දේපළ, පිරියත සහ උපකරණවලට කිසිදු එකතු කිරීමක් හෝ ඉවත් කිරීමක් වර්ෂය තුළ සිදුවී නොමැත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**රෝස් සමාජය** සඳහා පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අවන්හල් වෙළෙඳ ගිණුම. (ලකුණු 03)

(b) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් සහ වියදම් ගිණුම. (ලකුණු 07)

(මුළු ලකුණු 10)

## 08 වන ප්‍රශ්නය

**පෙරේරා මහතා, පැටී කලෙක්ෂන්** නම් වූ ඔහුටම අයිති සත්ව ආහාර අලෙවිසැලක් (farm shop) පවත්වාගෙන යන අතර, ඔහු නිසිපරිදි ගිණුම් පොත්පත් පවත්වා නොගනී.

පහත සඳහන් තොරතුරු **පැටී කලෙක්ෂන් හි** පොත්වලින් උපුටාගන්නා ලදී:

(1) ව්‍යාපාරයේ වත්කම් සහ වගකීම් පහත සඳහන් පරිදි වේ:

*(රු.'000)*

| | **2017 අප්‍රේල් 01 දිනට** | **2018 මාර්තු 31 දිනට** |
|---|---:|---:|
| ඉඩම සහ ගොඩනැගිල්ල ධාරණ අගයට | 15,000 | 13,000 |
| මෝටර් වාහන ධාරණ අගයට | 7,000 | 9,000 |
| තොගය පිරිවැයට | 5,000 | 7,000 |
| බැංකු ශේෂ | 6,000 | ? |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 6,000 | 7,000 |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 7,000 | 9,000 |
| උපචිත විදුලිය | 500 | 750 |

(2) 2017 ඔක්තෝම්බර් 01 දින ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා මෝටර් වාහනයක් රු.5,000,000/- ක පිරිවැයකට, මිලදී ගන්නා ලදී. ඒ හැර, වර්ෂය තුළ වෙනත් කිසිදු දේපළ, පිරියත සහ උපකරණවල එකතුකිරීමක් හෝ ඉවත් කිරීමක් හෝ සිදුවී නොමැත.

(3) වර්ෂය තුළ ඔහුගේ පෞද්ගලික ප්‍රයෝජනය සඳහා රු.1,000,000/- ක් ව්‍යාපාරයේ බැංකු ගිණුමෙන් ඔහු ආපසු ලබාගන්නා ලදී.

(4) වර්ෂය තුළ කරන ලද වෙනත් බැංකු ගෙවීම් පහත පරිදි වේ:

| | **රු.'000** |
|---|---:|
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් සඳහා ගෙවීම් | 45,000 |
| අලුත්වැඩියා සහ නඩත්තු | 500 |
| විදුලිය | 1,500 |
| වැටුප් | 5,000 |

(5) සියලුම මිලදී ගැනුම් සහ විකුණුම් ණය පදනම මත වේ.

(6) **පෙරේරා මහතා,** සියලුම විකුණුම් සඳහා පිරිවැය මත 50% ක දළ ලාභයක් තබා ගනී.

(7) සියලුම ගනුදෙනු ව්‍යාපාරික බැංකු ගිණුම හරහා සිදුකරනු ලැබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2018 මාර්තු 31 දිනට **පැටී කලෙක්ෂන්** හි ශේෂ පිරික්සුම **පිළියෙල කරන්න.** (ලකුණු 10)

## **09** වන ප්‍රශ්නය

**අශාන්, හෂාන්** සහ **රොෂාන්, "ද ශාන්ස්",** හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවන් වූ අතර පිළිවෙලින් 2:2:1 අනුපාතයට ලාභ'ලාභ බෙදාගනු ලැබේ.

(1) හවුල් ගිවිසුමෙහි පහත සඳහන් කරුණු ඇතුළත් විය:

- හවුල්කරුවන්ගේ ආරම්භක ප්‍රාග්ධන ගිණුම් ශේෂයන් මත වාර්ෂිකව 5% බැගින් වූ ප්‍රාග්ධනය මත පොලියක් ලැබීමට හවුල්කරුවන්ට හිමිකම ඇත.
- රු.15,000/- බැගින් වූ මාසික වැටුපක් ලැබීමට **හෂාන් ට,** හිමිකම ඇත.

(2) 2018 මාර්තු 31 දින, **රොෂාන්** හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාම ගැනීමට තීරණය කළ අතර, **අශාන්** සහ **හෂාන්** පහත සඳහන් කොන්දේසිවලට එකඟ විය:

- 2018 මාර්තු 31 දිනට, හවුල්ව්‍යාපාරයේ කීර්තිනාමය රු.1,800,000/- කට අගය කළ අතර, කීර්තිනාම ගිණුමක් භාවිත නොකොට, හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් හරහා ඒ සඳහා ගැලපීම් කළ යුතු වේ.
- 2018 මාර්තු 31 දිනට, ඉඩම සහ ගොඩනැගිලි පහත සඳහන් පරිදි ප්‍රත්‍යාගණනය කරන ලදී: *(රු.'000)*

| | **2018 මාර්තු 31 දිනට ප්‍රත්‍යාගණනය කළ අගය** | **පිරිවැය** | **2018 මාර්තු 31 දිනට සමුච්චිත ක්ෂය** |
|---|---|---|---|
| ඉඩම සහ ගොඩනැගිලි | 2,400 | 1,800 | 300 |

  ඉඩම සහ ගොඩනැගිලි ප්‍රත්‍යාගණිත අගයට පවත්වාගෙන යනු ලැබේ.

- **රොෂාන්** වෙත ගෙවිය යුතු මුළු මුදල ඔහු විශ්‍රාම ගැනීමෙන් මසකට පසු සම්පූර්ණයෙන්ම පියවා දැමිය යුතුය.
- **අශාන්** සහ **හෂාන්** අතර ලාභ'ලාභ, පිළිවෙලින් 3 : 2 අනුපාතයට බෙදාගත යුතුය.

(3) 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජනය කිරීමට පෙර, හවුල් ව්‍යාපාරයේ ශුද්ධ ලාභය රු.2,500,000/- ක් විය.

(4) 2018 මාර්තු 31 දිනට හවුල් ව්‍යාපාරයේ ශේෂ පිරික්සුමෙන් පහත සඳහන් ශේෂ උපුටාගන්නා ලදී:

| | **හර (රු.'000)** | **බැර (රු.'000)** |
|---|---|---|
| 2017 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධන ගිණුම්: | | |
| **අශාන්** | | 5,000 |
| **හෂාන්** | | 3,000 |
| **රොෂාන්** | | 2,000 |
| 2017 අප්‍රේල් 01 දිනට ජංගම ගිණුම්: | | |
| **අශාන්** | | 500 |
| **හෂාන්** | | 300 |
| **රොෂාන්** | 200 | |

**ඔබ විසින් කළ යුතු දෑ:**

2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **"ද ශාන්ස්"** හවුල් ව්‍යාපාරයේ ඉහත ගනුදෙනු සටහන් කිරීමට පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) හවුල්කරුවන්ගේ ජංගම ගිණුම්. (ලකුණු 04)

(b) හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම්. (ලකුණු 06)

(මුළු ලකුණු 10)

*C කොටසෙහි අවසානය*

# D කොටස

අනිවාර්යය ප්‍රශ්නයකි.

(ලකුණු 25)

## 10 වන ප්‍රශ්නය

වෙළඳ ව්‍යාපාරයක යෙදී සිටින සමාගමක් වූ **සීමාසහිත ජය (පෞද්ගලික) සමාගමේ** 2018 මාර්තු 31 දිනට ගිණුම් පොත්වලින් උපුටාගත් ශේෂ පිරික්සුම පහත පරිදි වේ:

*(රු.'000)*

| | හර | බැර |
|---|---|---|
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස් 300,000) | | 45,000 |
| 2017 අප්‍රේල් 01 දිනට, රඳවාගත් ඉපැයීම් | | 10,000 |
| ගෙවූ අතුරු ලාභාංශ | 2,500 | |
| 10% ණයකර | | 25,000 |
| ඉඩම සහ ගොඩනැගිලි පිරිවැයට (ඉඩම - රු. මිලියන 20) | 70,000 | |
| මෝටර් වාහන | 90,000 | |
| 2017 අප්‍රේල් 01 දිනට, සමුච්චිත ක්ෂය: | | |
| ගොඩනැගිලි | | 14,000 |
| මෝටර් වාහන | | 36,000 |
| 2018 මාර්තු 31 දිනට, තොගය | 55,000 | |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 45,500 | |
| 2017 අප්‍රේල් 01 දිනට වෙළෙඳ ලැබිය යුතු මුදල් සඳහා දීමනාව | | 1,250 |
| ගෙවූ ආදායම් බදු | 2,650 | |
| විකුණුම් | | 368,000 |
| විකුණුම් පිරිවැය | 235,000 | |
| බෙදාහැරීමේ වියදම් | 15,000 | |
| පරිපාලන වියදම් | 43,000 | |
| ගෙවූ ණයකර පොලී | 1,250 | |
| අතැ'ති සහ බැංකුවේ මුදල් | 750 | |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | | 48,000 |
| අවිනිශ්චිත ගිණුම | | 11,000 |
| 2017 අප්‍රේල් 01 දිනට, ආදායම් බදු ප්‍රතිපාදනය | | 2,400 |
| | **560,650** | **560,650** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2018 මාර්තු 31 දිනට, අවසන් තොගය ගණන්කර, පිරිවැය මත ඇගයීම් කොට, ගිණුම් පොත්වලට ගෙන තිබුණි. 2018 අප්‍රේල් 20 දින සිදුකරන ලද සමාලෝචනයකදී හෙළිදරව් වූයේ රු.5,000,000/- ක් පිරිවැය වූ ඉහත කී තොගයෙන් කොටසක් යල්පැන ගිය තත්ත්වයට පත්වී ඇති බැවින් ඒවා 2018 අප්‍රේල් 30 දින රු.4,200,000/- කට විකිණීමට අපේක්ෂිත බවයි.

(2) 2017 අප්‍රේල් 01 දින, සමාගම එකක් රු.100/- බැගින් වූ 10% ණයකර 250,000 ක් නිකුත් කරන ලදී. ණයකර මත පොලිය වර්ෂයකට දෙවතාවක් (biannually) ගෙවිය යුතු වේ. වර්ෂය තුළදී ගෙවන ලද පොලිය ගෙවූ ණයකර පොලී ගිණුමට අයකර ඇත.

(3) දේපළ, පිරියත සහ උපකරණ, පිරිවැය මත, සරල මාර්ග ක්‍රමය අනුව ක්ෂය කළ යුතුව ඇත. වත්කම්වල ප්‍රයෝජනවත් ආයුකාලය පහත පරිදි ඇස්තමේන්තු කර තිබේ:

| | | |
|---|---|---|
| ගොඩනැගිලි | : | වර්ෂ 25 |
| මෝටර් වාහන | : | වර්ෂ 10 |

වර්ෂය සඳහා වූ මුළු ක්ෂය, පරිපාලන වියදම්වලට හරකර අවිනිශ්චිත ගිණුමට බැරකොට ඇත.

(4) සමාගම වෙත රු.500,000/- ක් ගෙවීමට තිබූ ගනුදෙනුකරුවෙකු 2018 මැයි 05 දින මියගිය අතර, ඒ අනුව ඔහුගෙන් ලැබිය යුතු මුදල් අයකරගත නොහැකි තත්ත්වයට පත්විය. තවද, වර්ෂය අවසානයේදී ඉතිරි වෙළෙඳ ලැබිය යුතු මුදල් ශේෂයෙන් 5% ක් වෙළෙඳ ලැබිය යුතු මුදල් සඳහා දීමනාව වශයෙන් පවත්වාගත යුතු බවද තීරණය කරන ලදී.

(5) පහත සඳහන් උපචිත සහ කලින් ගෙවූ වියදම්, 2018 මාර්තු 31 දිනට, ගිණුම්ගත කළ යුතු වේ:

| | රු. |
|---|---|
| උපචිත ගොඩනැගිලි නඩත්තු වියදම් | 400,000 |
| කලින් ගෙවූ ප්‍රචාරණ වියදම් | 150,000 |

(6) 2016/17 තක්සේරු වර්ෂය සඳහා මුළු ආදායම් බදු වගකීම, රු.2,650,000/- ක් ලෙස අවසන් නිගමනයකට පැමිණි අතර, 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය තුළදී සම්පූර්ණයෙන් පියවා දමන ලදී. ගෙවූ මුදල, ගෙවූ ආදායම් බදු ගිණුමට හරකර තිබේ. 2017/18 තක්සේරු වර්ෂය සඳහා මුළු ආදායම් බදු වගකීම රු.2,800,000/- ක් වෙතැයි ඇස්තමේන්තුකර ඇත.

(7) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා 2018 ජූනි 30 දින අනුමත කරන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**සීමාසහිත ජය (පෞද්ගලික) සමාගමේ,** කළමනාකරණයේ භාවිතය සඳහා පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභා'ලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය (විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය). (ලකුණු 12)

(b) 2018 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 13)

(මුළු ලකුණු 25)

*D කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| **01 මට්ටම**<br>**අවබෝධය**<br><br>වැදගත් තොරතුරු ආවර්ජනය සහ පැහැදිලි කිරීම. | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |
| | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | **හඳුනා දක්වන්න** | යමක් මනා සැලකිලිමත් වීමකින් අනතුරුව හඳුනා ගැනීම හෝ තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව අදාල කරුණු එකින් එක වචනයෙන් ලියා දැක්වීම. |
| | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාවය පෙන්නුම් කිරීම හෝ තහවුරු කිරීම. |
| | **සඳහන් කරන්න** | යමක් ස්ථිර ලෙස පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම. |
| | **විමසන්න** | අවසන් නිගමනයකට පිවිසීම සඳහා විවිධ පැතිකඩ තර්කානුකූලව සවිස්තරව පරීක්ෂා කිරීම. |
| | **පැහැදිලි කරන්න** | අදාල කරුණු සවිස්තරාත්මකව දැක්වීම. |
| | **අර්ථකතනය කරන්න** | අවබෝධයට පහසු සුපුරුදු පද මගින් අර්ථය ඉදිරිපත් කිරීම. |
| | **හඳුනාගන්න** | සෙවීමෙන් හෝ ප්‍රයත්න දැරීමෙන් නිගමනයකට එළඹීම. |
| | **සටහන් කරන්න** | අදාල කරුණු විස්තරාත්මකව සටහන් කිරීම. |
| | **සාරාංශගත කරන්න** | කරුණු වශයෙන් හෝ සංඛ්‍යා වශයෙන් ප්‍රධාන කරුණු කෙටියෙන් දැක්වීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| **02 මට්ටම**<br>**භාවිතය**<br><br>ඉගෙනගත් පසුබිම නොවන පසුබිමක දැනුම භාවිත කිරීම / සංවෘත ගැටළු විසඳීම. | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යොදන්න. |
| | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | **ප්‍රදර්ශනය කරන්න** | සුවිශේෂී ලෙස උදාහරණ සමග ඔප්පු කරන්න. |
| | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | **පිළියෙල කරන්න** | දී ඇති විස්තර සැලැස්මකට ගොනු කිරීම. |
| | **ප්‍රමුඛතා දක්වන්න** | වැදගත්කම, අනුපිළිවෙල අනුව දක්වන්න. |
| | **සසඳන්න** | තවත් දෙයක් සමග සංගත වේදැයි බැලීම. |
| | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| **03 මට්ටම**<br>**විශ්ලේෂණය**<br><br>අදහස් අතර සම්බන්ධතා ගොඩනගා සමාන අසමානතා බැලීම / විවෘත ගැටළු විසඳීම. | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |
| | **සමානකම් බලන්න** | සමානකම් සොයා ගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |